www.agaram.lk

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | නර්තනය | ඒකකය : 13 |
|---|---|---|

## ගීත අසමු, රස විඳිමු, නටමු

- **ප්‍රශ්න අංක 01 සිට 06 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) ගීතයක් රසවිඳීමේදී,

1) පද මාලාව අර්ථවත් ද යන්න විමසිය යුතුය.
2) සංගීතයේ සහ නාද මාලාවේ උචිත බව විමසිය යුතුය.
3) හොඳින් ගායනා කිරීම ප්‍රමාණවත් ය.
4) පද මාලාව, සංගීතය, නාද මාලාව, ගායනය යන සියලු අංග විමසිය යුතුය.

02) ගීතයකට අනුව නර්තනයක් ඉදිරිපත් කිරීමේදී ගීතයෙන් කියැවෙන අරුත ප්‍රකාශ කිරීම සඳහා,

1) භාව ප්‍රකාශන දක්ෂතාව අවශ්‍ය කෙරේ.
2) තාල අවබෝධය භාවිත කෙරේ.
3) වාදනයට අනුව නර්තනය දැක්වීමේ හැකියාව අවශ්‍ය වේ.
4) චලන නිර්මාණ කුසලතාව අවශ්‍ය වේ.

03) රංග ශිල්පියෙකු රංගනයේදී භාව සහ අභින ප්‍රකාශනයේ දක්ෂතාව දක්වන්නේ,

1) නිරීක්ෂණයෙන්
2) පරිසර සිද්ධි අනුකරණයෙන්
3) දීර්ඝ කාලීන අභ්‍යාසයෙන්
4) අන් අයගේ ඉදිරිපත් කිරීම දැක බලා ගැනීමෙන්

04) ''මගෙ පොඩි යාලු - නෙළුමු ද ඕලු'' නමැති ගීතය,

1) තාලානුකූල එකකි.
2) රිද්මයානුකූල එකකි.
3) තාලයට නොයෙදෙන ගීතයකි.
4) අනාඝතාත්මක එකකි.

05) ''මගෙ පොඩි යාලු - නෙළුමු ද ඕලු'' ගීතයේ පද රචනා කර ඇත්තේ,

1) මහගමසේකර ය.
2) මහින්ද දිසානායක ය.
3) මහාචාර්ය සුනිල් ආරියරත්න ය.
4) ප්‍රේමකීර්ති ද අල්විස් ය.

06) ''පාන්දරින් ඉස්කෝලෙට ටැන්ටු කරත්තෙන්'' ළමා ගීතයේ පද රචකයා,

1) කේ. ඩී. කේ. ධර්මවර්ධන ය.
2) මඩවල රත්නායක ය.
3) සෝමතිලක දිසානායක ය.
4) චිත්‍රානන්ද අබේසේකර ය.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **කෙටි පිළිතුරු සපයන්න.**

**"පාන්දරින් ඉස්කෝලෙට ටැන්ටු කරත්තෙන්" යන ගීතය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

07) මෙම ගීතය සම්පූර්ණයෙන් ලියන්න.

08) මෙම ගීතයේ පද රචනා කළේ කවුද?

09) මෙම ගීතයේ සංගීත නිර්මාණය කාගේ ද?

10) මෙම ගීතය ගායනා කරන්නේ කවුරුන් විසින් ද?

11) මෙම ගීතයේ ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

**"මගේ පොඩි යාලු - නෙළුමු ද ඕලූ" යන ගීතය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

12) මෙම ගීතය සම්පූර්ණයෙන් ලියන්න.

13) මෙම ගීතයේ පද රචනා කළේ කවුද?

14) මෙම ගීතයේ සංගීත නිර්මාණය කාගේ ද?

15) මෙම ගීතය ගායනා කරන්නේ කවුරුන් විසින් ද?

16) මෙම ගීතයේ ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

17) මෙම ගීත ගායනයේදී ඔබ සිත් ගත් අවස්ථා මොනවාදැයි සඳහන් කරන්න.

18) රාත්‍රී කාලයක් බව ඇඟවීමට මෙම ගීතයේ යොදා ඇත්තේ කුමන වචන ද?

19) ඉහත ගීතයක් ඇසුරෙන් උදෑසනක පරිසරයේ දැකිය හැකි සිදුවීම් කීපයක් සඳහන් කරන්න.

20) මෙම ගීතවලින් අපට ලබා ගත හැකි ආදර්ශ මොනවා ද?

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk